සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2020
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2020
General Certificate of Education (Adv. Level) Examination, 2020

ක්‍රිස්තියානි ධර්මය II
கிறிஸ்தவம் II
Christianity II

43 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස් :**

✳ I කොටසින් ප්‍රශ්න **දෙකක්** ද, II කොටසින් ප්‍රශ්න **තුනක්** ද තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) පංච පුස්තකය හඳුන්වන වෙනත් නම් **දෙකක්** ලියන්න. (ලකුණු 02යි)

 (ii) ශුද්ධ බයිබලයේ පසුබිම ගැන ගැඹුරු විමර්ශනයක යෙදුන ලූතරන් නිකායට අයත් ජර්මන් ජාතික විශාරදයන් විසින් පංච පුස්තකයේ කර්තෘත්වය මෝසෙස්ට ආරූඪ කිරීම ප්‍රශ්න කරන ලදී. ඔවුන් ගෙනහැර පෑ තර්ක **දෙකක්** දක්වන්න. (ලකුණු 04යි)

 (iii) උත්පත්ති පොතේ පළමු පරිච්ඡේද එකොළහ අධ්‍යයනය කිරීමේ දී සැලකිය යුතු කරුණු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

 (iv) ද්විතීය නීති සම්ප්‍රදාය (Deuteronomical tradition) මගින් ඉදිරිපත් කෙරෙන තේමා සහ ධර්ම, කරුණු **හතරක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

2. (i) සමදර්ශක ශුභාරංචි ගැටලුව පිළිබඳව කරුණු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02යි)

 (ii) සමදර්ශක ශුභාරංචි අතර දක්නට ඇති සමානකම් **දෙකක්** උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 04යි)

 (iii) සමදර්ශක ශුභාරංචි හා ජොහන් ශුභාරංචිය අතර දක්නට ඇති අසමානතා **තුනක්** උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 06යි)

 (iv) ධර්මදූත ප්‍රචාරය සඳහා ශුද්ධ වූ පාවුලුතුමා විසින් සිදුකළ ක්‍රියාමාර්ග **හතරක්** සඳහන් කර, ඒවා ඉදිරියට ගෙනයෑමට ඔබහට ගත හැකි ක්‍රියාමාර්ග **හතරක්** උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

3. (i) ශුද්ධ වූ පේදුරුතුමා ජෙරුසලම් මන්ත්‍රණ සභාව තුළ දී ප්‍රබල ලෙස කථා කරමින් පැහැදිලි කළේ කුමක් ද? (ලකුණු 02යි)

 (ii) අපොලොජිස්ත ලේඛකයෝ හෙවත් තර්කවේදීන් හඳුන්වා ඔවුන්ගේ කෘතිවල පොදු අරමුණු දෙක ලියන්න. (ලකුණු 04යි)

 (iii) වැලේරියන් අධිරාජ්‍ය සමය තුළ (ක්‍රි.ව. 254 - 260 දක්වා) කිතුනුවන් මුහුණ පෑ පීඩන **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06යි)

 (iv) වර්තමාන සමාජය තුළ ක්‍රියාවට නැංවිය හැකි මුල් සභාවේ තිබූ ලක්ෂණ **හතරක්** සඳහන් කර එම ලක්ෂණ නූතනයේ ක්‍රියාත්මක කිරීමට යාමේ දී මුහුණ දිය හැකි අභියෝග පැහැදිලි කරන්න. (ලකුණු 08යි)

[දෙවැනි පිටුව බලන්න.

## II කොටස

4. (i) ශුද්ධ බයිබලයේ සඳහන් පරිදි මැවීම පිළිබඳ පළමු කතාවේ පළමු දින පහ තුළ මවන ලද දෑ අනුපිළිවෙළින් විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) ඉහත 4(i) කතාවේ සඳහන් මිනිසා මත පැවරුණු වගකීම සඳහන් කර, එය ඔබ ජීවිතයේ දී සපුරාලන අයුරු කරුණු **හතරක්** ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 10යි)

5. (i) ශුද්ධ බයිබලයේ ගීතාවලියේ සියලුම ගීත, කරුණු හතක් යටතේ වර්ගීකරණය කළ හැක. ඉන් **පහක්** සඳහන් කර ඒවා විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) ගීතාවලියේ 23 ගීතය සාරාංශ කර, එය පදනම් කොටගෙන ක්‍රිස්තුන් වහන්සේ හා ඔබ අතර ඇති සම්බන්ධය කරුණු **පහක්** කෙරෙහි අවධානය යොමු කරමින් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

6. (i) ශුද්ධ වූ මතෙව්තුමා ගෙනහැර දක්වන සභාවේ සාංඝිකත්වය හා එහි අධිකාරිය පිළිබඳ දේශනයෙහි අඩංගු කරුණු **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) කිසියම් ජන කණ්ඩායමක නායකත්වය සඳහා ඔබ තුළ තිබිය යුතු ගුණාංග **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

7. (i) සයවන සියවස තුළ කිතුනු සභාවේ ලක්ෂණ **පහක්** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) ජාතික සමගිය හා ආගමික සහජීවනය ගොඩනැගීමට ඔබ දායක වන ආකාරය කරුණු **පහක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

8. (i) නිදහසින් පසු යුගයේ දී ශ්‍රී ලංකාවේ උන්නතිය සඳහා කිතුනු සභාව සිදුකළ සේවා කරුණු **පහකින්** විස්තර කරන්න. (ලකුණු 10යි)

(ii) ශුද්ධ වූ ජුසේ වාස් මුනිතුමාගේ ජීවිතාදර්ශය පෙරදැරි කර ගනිමින් තරුණ තරුණියන් වශයෙන් සමාජය තුළ ඔබ ක්‍රියාකරන ආකාරය කරුණු **පහක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10යි)

* * *